# 10 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

## නාට්‍ය ශෛලීය










අන්තර්ගතය - විජිත බණ්ඩාර- බප/ගම්/සියනෑ ජාතික පාසල, දොම්පේ
සැකසුම - පියුමිණී ඔටුනුපණ්ඩිත - කෑ / ශාන්ත මරියා විද්‍යාලය, කෑගල්ල

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# නාට්‍ය ශෛලිය







The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# නාට්‍ය ශෛලිය

- ප්‍රේක්ෂකයා නාට්‍ය නරඹන විට නාට්‍යයේ සතර අභිනය යොදාගෙන ඇති ස්වභාවය අනුව ශෛලිය කොටස්වන බව හඳුනාගත හැක.

- එහිදී ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ලෙස ප්‍රධාන ශෛලීන් දෙකක් හඳුනාගත හැකිය.

- භරත මුනිවරයා මෙම සංකල්පය නාට්‍ය ශාස්ත්‍රයේදී ඉදිරිපත් කරයි.

- ප්‍රධාන ශෛලීන් දෙකෙහිම ලක්ෂණ මිශ්‍රව යෙදෙන ශෛලිය මිශ්‍ර නාට්‍ය ශෛලිය ලෙස නම් කරයි.













The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# ලෝක ධර්මී

පාත්‍රයන් (නළු නිළියන්) ,

- ස්වභාවික ලෙස හැසිරෙන්නා වූත්
- අව්‍යාජ වූත්
- ලාලිත්‍ය යෙන් යුතු අංගචලනයන්ගෙන් තොරවූත්
- ස්වභාවික අභිනයන්ගෙන් යුක්ත වූත්
- නොයෙක් ස්ත්‍රීන් හා පුරුෂයන් (පාත්‍රයන් සේ) හැසිරෙන්නා වූත්

යම් නාට්‍යයක් වේද එය ලෝක ධර්මී නාට්‍යයකි.

*(භරතමුනි - නාට්‍ය ශාස්ත්‍රය)*

උදාහරණ:-
1. කැලණි පාලම - ආර් .ආර්. සමරකෝන්
2. මෝදර මෝල - රජිත් ධර්මකීර්ති
3. චෙරි වත්ත - චෙකෝව් (ඈන්ටන්)
4. සෙල්ලම් ගෙදර - ඉබ්සන් (හෙන්රි)







The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## මෙම ශෛලිය තුල සතර අභිනය භාවිතාවන අයුරු

ලෝක ධර්මී ශෛලියේදී සතර අභිනය භාවිතය ලෝකයේ සාමාන්‍ය ස්වභාවයට බෙහෙවින් සමාන වේ.

- වාචික → එදිනෙදා ජීවිතයේ සංවාද වලට සමානයි.
- ආංගික → එදිනෙදා ජීවිතයේ ශාරීරික හැසිරීම්වලට බෙහෙවින් සමානයි.
- සාත්වික → භාව ප්‍රකාශන (හැඟීම්) සාමාන්‍ය ජීවිතයේ මුහුණේ ඉරියව්වලට සමානයි.
- ආහාර්ය → ඇඳුම් පැළඳුම් , අංග රචනය , භාණ්ඩ සාමාන්‍ය ජීවිතයේ භාවිතා වන දේවල් සමඟ බෙහෙවින් සමානයි.

- ලෝක ධර්මී නාට්‍යවල පසුතල හා රංග භාණ්ඩ බහුලව යොදා ගන්නා අයුරු දැකිය හැකිය.
- කතා වස්තු බොහෝදුරට සමකාලීන සමාජයෙන් ලබාගත් අත්දැකීම් පදනම් කරගෙන බිහි වූ බව පෙනේ.
- දහනවවන සියවසේදී හෙන්රි ඉබ්සන් , එමිලි සෝලා , ඇන්ටන් චෙකොව් වැනි නාට්‍යකරුවන් නාට්‍ය ධර්මී ශෛලිය ඇති කිරීමට පුරෝගාමී විය.

ආපසු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# නාට්‍ය ධර්මී




අසාමාන්‍ය සංවාද හා ,
අසාමාන්‍ය රඟපෑම්වලින් යුක්ත වූද ,
අසාමාන්‍ය චිත්ත වෘත්තීන් හා
භාවයන් නිරූපණය කරන්නා වූ ද ,
ලාලිත්‍යයෙන් යුතු අංගහාර හා අභිනයෙන් යුක්ත වූද ,
නාට්‍යමය ලක්ෂණයන්ගෙන් උපලක්ෂිත වූද ,
ස්වර හා අලංකාර සහිත වූද ,
අස්වාභාවික ලෙස හැසිරෙන පාත්‍රයන් ඇසුරු කරන්නා වූද ,
යම් නාට්‍යයක් වේ නම් එය නාට්‍ය ධර්මී ලෙස හඳුන්වයි.

*(භරතමුනි - නාට්‍ය ශාස්ත්‍රය)*




උදාහරණ :- 1. මනමේ / සිංහබාහු - එදිරිවීර සරච්චන්ද්‍ර
2. ඇන්ටිගනී / ඊඩිපස් - සොෆොක්ලීස්
3. සකුන්තලා - කාලිදාස
4. රත්නාවලී - ශ්‍රී හර්ෂ
5. නො / කබුකි - ජපන් නාට්‍ය


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

➢ ලොව පැරණිම නාට්‍ය කලාවන් නාට්‍ය ධර්මී ශෛලියට අයත් වේ. එනම්

- ග්‍රීක
- රෝම
- එළිසබත්
- සංස්කෘත
- ජපන් නො කබුකි

<u>මෙම ශෛලිය තුළ සතර අභිනය භාවිතාවන අයුරු</u>

- වාචික ⟶ ගීතමය පද්‍ය සංවාද හා තාලානුකූලව ගැයෙන ගද්‍ය සංවාද.
- ආංගික ⟶ තාලයට අනුව සිදුවන ගමන් තාල හස්ත මුද්‍රා භාවිතය. විවිධ සංකේතාත්ම ඉරියව් (නින්ද , අශ්ව රිය පැදවීම , වාඩිවීම)
- සාත්වික ⟶ අතිශෝක්තියට නගන ලද භාව ප්‍රකාශන වෙස් මුහුණු භාවිතය.
- ආහාර්ය ⟶ ගීත මගින් පරිසරය මවා පෑම , රංග භාණ්ඩ අඩුවෙන් භාවිත කිරීම , පසුතල භාවිතා නොවීම , අංගරචන දීප්තිමත් වර්ණ මගින් වෙස් මුහුණකට සමාන ලෙස යෙදීම.(කබුකි මුහුණ) , සංගීතය නාට්‍ය පුරා දක්නට ලැබීම හා රංග වින්‍යාස බහුලව යොදා ගැනීම.



Copyright © e-thaksalawa.moe.gov.lk

- සමස්තයක් ලෙස මෙම නාට්‍ය ශෛලිය චිත්තාකර්ෂණීය ලක්ෂණවලින් සමන්විතය.
- කතා පුවත් බොහෝ දුරට රජකතා , ඓතිහාසික කතා , ජාතක කතා හා වීර කාව්‍ය වැනි මූලාශ්‍ර මගින් උපුටාගෙන ඇත.
- ලංකාවේ මනමේ , සිංහබාහු , ප්‍රේමතෝ ජායතී ශෝකෝ වැනි නාට්‍ය මේ ශෛලියට හොඳම නිදසුන් වේ.




ආපසු

# මිශ්‍ර ශෛලිය

නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී ලක්ෂණ මිශ්‍රව යෙදෙන නාට්‍ය වර්ගය මිශ්‍ර ශෛලිය නමින් හඳුන්වයි. මෙහිදී අදාල ශෛලීන් දෙකෙහිම ලක්ෂණ සැලකිය යුතු ප්‍රමාණයක් තිබීම මිශ්‍ර ශෛලියට අයත්වීමට බලපායි.

උදාහරණ:-
1. නරිබෑනා - දයානන්ද ගුණවර්ධන
2. කදාවළලු - එදිරිවීර සරච්චන්ද්‍ර
3. හස්තිකාන්ත මන්තරේ - එදිරිවීර සරච්චන්ද්‍ර
4. කුවේනි - හෙන්රි ජයසේන





## මිශ්‍ර ශෛලිය තුළ සතර අභිනය භාවිතාවන අයුරු

- වාචික → සාමාන්‍ය ගද්‍ය සංවාද හා ගීතමය ගද්‍ය හා පද්‍ය සංවාද මිශ්‍රව භාවිතා වේ
- ආංගික → සාමාන්‍ය හැසිරීම් මෙන්ම තර්කානුකූල අසාමාන්‍ය හැසිරීම් භාවිතා වේ
- සාත්වික → සාමාන්‍ය ජීවිතයේ හැඟීම් ප්‍රකාශයන්ට බෙහෙවින් නැඹුරු වේ.
- ආහාර්ය → ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ලක්ෂණ දෙකටම අනුව මෙම අභිනය ක්‍රියාත්මක වේ.

ආපසු


Copyright © e-thaksalawa.moe.gov.lk